සැබැවින්ම මාගේ සමූහයාගේ වන්දනා ගමන යනු අල්ලාහ්ගේ මාර්ගයේ කැපවීමයි.

අබූ උමාමා-රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.‘අහෝ අල්ලාහ්ගේ
දූතයාණනි! වන්දනා ගමනක නිරත වන්නට මට අවසරය දෙනු යැයි මිනිසෙකු පවසා සිටියේය. එවිට නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා “සැබැවින්ම මාගේ සමූහයාගේ වන්දනා ගමන යනු අල්ලාහ්ගේ මාර්ගයේ කැපවීමයි.“යැයි පවසා සිටියහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

සැබැවින්ම නැමදුම් සීමා කරන ලද්දකි. ෂරීආව සීමා කළ ක්රමයට අනුව මිස එය ඉටු කිරීම මුස්ලිම්වරයාට අනුමත නොවන්නේය. එහෙයින් වන්දනා කරනු පිණිස මහපොළොවේ සැරිසැරීමට අපේක්ෂා කළ මිනිසා දෙස බලා නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා: සැබැවින්ම මෙය කිතුනුවන්ගේ ක්රියාදාමයකි. මහපොළොවේ වන්දනා ගමන යනු එහි ඉස්ලාමය ප්රචාරය කිරීමය. ඉස්ලාමිකයින් අතර වන්දනා ගමන යනු අල්ලාහ්ගේ දහම උසස් කරනු පිණිස අල්ලාහ්ගේ මාර්ගයේ කැපවීමය යැයි පවසා සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/5033